# <u>පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය</u>

**AAT/ 323/2019 (NPC)**

1. ටී.ජේ.බී.හේරත්, උප පොලිස් පරීක්ෂක

**<u>අභියාචක</u>**

**<u>එදිරිව</u>**

**ජාතික පොලිස් කොමිසම**

**<u>වගඋත්තරකරු</u>**

දිනය :-2025.02.20

ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)
ජේ.ජේ.රත්නසිරි (සාමාජික)
එස්.නන්දසේකරන් (සාමාජික)

පෙනී සිටීම :- ටී.ජේ.බී.හේරත්, අභියාචක සිටී.

අභියාචක වෙනුවෙන් රැකවරණ නිලධාරී, විශ්‍රාමික පොලිස් පරීක්ෂක, තිස්ස ගුණතිලක මහතා

වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂක, මාලා බස්නායක මහත්මිය

ජේ.ජේ.රත්නසිරි මහතා - (සාමාජික) පරි. අභි.විනි. අධිකාරය

## -<u>නියෝගය</u>-

අභියාචක ටී.ජේ.බී.හේරත්, උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස කොටහේන පොලිස් ස්ථානයට අනුයුක්තව ජම්පටාවීදිය පොලිස් මුරපොලේ ස්ථානාධිපති ලෙස සේවය කරමින් සිටියදී සිදුකරන ලද රාජකාරී පැහැර හැරීම් හා / හෝ විෂමාචාරයේ යෙදීම පිළිබඳව සහකාර පොලිස් අධිකාරී

ජී.නිශාන්ත ද සොයිසා විසින් මූලික විමර්ශනයක් සිදුකර, බස්නාහිර පළාත භාර නියෝජ්‍ය පොලිස්පති මතුරට මහතාට යවන ලද අංක D 11/ASP/15 AB/2014 හා 2014.05.08 දින දරණ වාර්තාව අනුව, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ඔහුගේ අංක S/DIG/WP/D/CN/02/1 හා 2014.06.19 දින දරණ චෝදනා පත්‍රය ලබාදී ඇත. මෙම චෝදනා පත්‍රය යටතේ චෝදනා 03ක් ගොනු කර ඇත.

1. අපකීර්ති දායක හැසිරීම
2. අණට අකීකරුවීම
3. රාජකාරිය පැහැර හැරීම.

මේ පිළිබඳව සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණයක් විශ්‍රාමික පොලිස් අධිකාරී ඩී.රත්නපාල මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකර ඇති අතර, පරීක්ෂණයෙන් අදාළ චෝදනා තුනම ඔප්පුවීම මත, ඒක පුද්ගල විනිශ්චය සභාවේ නිර්දේශ මත 2018.08.07 දින විනය නියෝගය ලබාදී ඇත. අදාළ විනය නියෝගය අනුව,

i. අදාළ වැටප් වර්ධක දෙකක් විලම්භනය කිරීම,
ii. වසර 05 ගතවනතුරු කිසිදු උසස්වීමේ පරීක්ෂණයකට පෙනී සිටීමට නුසුදුස්සෙකු කිරීම
iii. වැඩ තහනමට ලක්වූ කාලයට හිඟ වැටුප් සහ වේතන හිමි නැත.

මෙම විනය නියෝගයට එරෙහිව අභියාචක ජාතික පොලිස් කොමිසමට අභියාචනයක් 2019.02.18 දින ඉදිරිපත් කර ඇත. අදාළ

අභියාචනය පිළිබඳව කරුණු අධ්‍යයනය කළ ජාතික පොලිස් කොමිෂම විසින් ඔහුගේ NPC/AP/DIS/72/**2019** හා **2019.11.05** දින දරණ ලිපිය මඟින් අභියාචනය ප්‍රතික්ෂේප කර ඇත. එම තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචක **2019.12.09** දින AAT/323/2019(NPC) යටතේ මෙම අධිකාරියට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය මඟින් අභියාචක ඉල්ලා සිටින්නේ,

i. මෙම අභියාචනය භාරගෙන විභාගය සඳහා නියම කරන ලෙසත්,

ii. විනය නියෝගය පැනවීමට උපයෝගී කරගත් චෝදනා පත්‍රය සම්බන්ධයෙන් වූ විධිමත් විනය පරීක්ෂණයේ නිලධාරීගේ වාර්තාව ඇතුළු සියළු පරීක්ෂණ සටහන් ගරු විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කිරීමට නියෝග කරන ලෙසත්,

iii. ඒ අනුව සාක්ෂිකරුවෙකු විය යුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත විසින් චෝදනා පත්‍රය ලබාදීම සහ විනය නියෝගය නිකුත් කිරීම ස්වභාවික යුක්ති මූලධර්මයන්ට පටහැනි බවට තීරණය කරන ලෙසත්,

iv. ඒ අනුව මා වෙත ලබාදී ඇති විනය නියෝගය අත් හිටුවන ලෙසත් විනය නියෝගය මඟින් ලබාදී ඇති දඬුවම් ඉවත් කරන ලෙස නියෝග කරන ලෙසත්,

v. ගරු පරිපාලන විනිශ්චය අධිකාරය සුදුසුයැයි සලකන වෙනත් සහනයන් සහ ප්‍රදානයන් ලබාදෙන ලෙසත් ය.

මේ අනුව මෙම අභියාචනයේ ප්‍රධානතම තර්කය වන්නේ, (අංක iii යටතේ කරනු ලබන ඉල්ලීම) සාක්ෂිකරුවෙකු විය යුතු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් චෝදනා පත්‍රය ලබාදීම සහ ඉන් අනතුරුව විනය නියෝගය නිකුත් කිරීම ස්වභාවික යුක්ති මූලධර්මයන්ට පටහැනි බවයි.

අදාළ චෝදනා පත්‍රයට අනුව මෙම චෝදනා සනාථ කිරීම සඳහා සාක්ෂිකරුවන් 18ක් නම් කර ඇත. එසේම ලිපි ලේඛන 33ක් ඒ සඳහා උපයෝගී කරගෙන ඇත. මේ අනුව පැහැදිලි වන්නේ තනි පුද්ගලයෙකුගේ අභිමතය පරිදි මෙම කටයුතු සිදුවී නැති බවයි.

බස්නාහිර පළාත් භාර නියෝජ්‍ය පොලිස්පති මතුරට මහතාගේ නිරීක්ෂණ වාර්තාව මත මෙම චෝදනා පත්‍රය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත අනුර සේනානායක විසින් 2014.06.19 දින ලබාදී ඇති අතර, විනය නියෝගය ලබාදී ඇත්තේ 2019.08.07 දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත නන්දන මුනසිංහ නැමැති අයකු විසිනි. රාජ්‍ය සේවා කොමිෂම විසින් 2021.12.22 දින හා PSC/APL/4/45/2021 අංක දරණ මෙම අධිකාරයට ගොනු කරන ලද නිරීක්ෂණ මගින් පැහැදිලිව අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත. ජාතික පොලිස් කොමිෂම විසින් ඔවුන්ගේ අංක AAT/323/2019 (NPC) හා 2024.05.20 දින දරණ මෙම අධිකාරය

වෙත ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ වාර්තාව මගින් ද එම ලිපියේ තොරතුරු තව දුරටත් තහවුරු කර ඇත.

අදාළ නිර්දේශ වලදී පැහැදිලිවම මෙම අභියාචක සහ එහි සඳහන් සැකකාරිය මේරි සෙල්වි නැමැති අය අතර පැවැති සබඳතාවය ඔප්පු කර ඇත. “**පැ.17**” ලෙස සළකුණු කළ බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශයේ ස්ථානාධිපති ප්‍රසන්න බ්‍රාහ්මණගේ ගේ අංක O/WPID/380/14 හා **2014.02.21** දින රහස්‍ය වාර්තාව හා “**පැ.18**” ලෙස සළකුණු කර ඇති දුරකථන විශ්ලේෂණ වාර්තාව හොඳම සාක්ෂි දෙකකි. අදාළ දුරකථන විශ්ලේෂණ වාර්තාව තුළින් **2013.12.15** දින සිට **2014.02.20** දින දක්වා කාලය තුළදී අභියාචකගේ අංක **011-2432591** දරණ ස්ථාවර දුරකථනයට හා අංක **071-5301898** දරණ ජංගම දුරකථනයට මේරි සෙල්වි නමින් ලියාපදිංචි අංක **071-0481132** දරණ ජංගම දුරකථනයෙන් ඇමතුම් **70**ක් ලබාගෙන ඇති අතර, ඇමතුම් **51** ක් ලැබී ඇත.

අවස්ථා රැසකදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හා නියෝජ්‍ය පොලිස්පති, සහකාර පොලිස් අධිකාරී විසින් නිකුත් කළ උපදෙස් පත්‍රිකා වල සහ උපදෙස් පන්ති වලදී මෙම සැකකාරිය මෙම ප්‍රදේශයේ මහා පරිමානයේ කුඩු විකුණන පුද්ගලයන්ගේ නාම ලේඛනයේ අංක 1 ට නම සඳහන් අයෙකු බවට හඳුන්වා දී ඇත. එසේම අදාළ ලේඛනයේ නම් සඳහන් ස්ථාන හා පුද්ගලයන් පරීක්ෂා කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් දී ඇත. එසේම සැකකාරියගේ නිවස අදාළ ජම්පටා වීදියේ පොලිස් මුරපොල

ළඟ සිට මීටර් 100ක් පමණ දුරකින් පිහිටා ඇත. අදාළ සැකකාරිය දින පතාම පාහේ පොලිස් මුරපොලට පැමිණ, ස්ථානාධිපති අභියාචක ඔහුගේ කාමරයේ දී මුණ ගැසෙන බව හා සාකච්ඡා කරමින් සිට පිටව යන බවට සාක්ෂි වලින් තහවුරු වී ඇත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව පෙනී යන්නේ මෙම සැකකාරිය මත්කුඩු ව්‍යාපාරය හා සම්බන්ධව සිටි බවත්, ඒ බැව් අවට පොලිස් ස්ථාන සියල්ලේම නිලධාරීන් මෙන්ම ප්‍රදේශය භාර සහකාර පොලිස් අධිකාරී හා පොලිස් අධිකාරී ඇතුළු නියෝජ්‍ය පොලිස්පති යන සියළු නිලධාරීන් දැන සිටි බවයි. එහෙත් අභියාචක මේ බැව් නොදැන සිටීම සහ / හෝ එය වසන්කර කටයුතු කිරීම රාජකාරිය පැහැර හැරීමක් ලෙස පෙනී යන බවත් ය.

පොලිස් ස්ථානයක ස්ථානාධිපතිගේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ ප්‍රදේශයේ නීතිය හා සාමය අරක්‍ෂා කර ගනිමින්, එම ප්‍රදේශයේ සිදුවන දූෂණ ක්‍රියා පිළිබඳව ඉහළ නිලධාරීන් දැනුවත් කර, ඒවා අවම කිරීමට කටයුතු යෙදීමය. එසේම අන් අයට ආදර්ශමත් පුද්ගලයෙකු ලෙස කටයුතු කිරීමය. මෙහිදී මෙම අභියාචක අතින් මෙම කාර්ය කොතරම් දුරට සාර්ථකව සිදුවූවා ද යන්න ගැටළු සහගතය. පැ.සා.2 පොලිස් පරීක්‍ෂක වන්දන ජයශ්‍රී ඇතුළු වෙනත් පොලිස් නිලධාරීන් කණ්ඩායමක් විසින් මෙම සැකකාරිය මත්කුඩු 12g හා 100mg සමඟ අත් අඩංගුවට ගෙන 2014.02.19 දින අධිකරණයට ඉදිරිපත් කර ඇත. ඒ අනුව අදාළ සැකකාරිය මත්කුඩු විකිණීම හා සම්බන්ධව සිටි බවට ඔප්පු වේ. ඉහත කරුණු අනුව චෝදනා

පත්‍රය ලබාදී අදාළ චෝදනා සියල්ල ඔප්පු වූවාට පසුව විනය බලධාරීන් ලබාදී ඇති වැටුප් වර්ධක 02ක් විලම්භනය කිරීම, වරදේ බරපතලකම අනුව ප්‍රමාණාත්මකව අඩු දඬුවමක් ලෙස පෙන්වා දිය හැක. ඉදිරියේ දී දඬුවම් නියම කිරීමේ දි වරදේ බරපතලකම හා එයින් සමාජයට හෝ ජනතාවට සිදුව අහිතකර බලපෑම පිළිබඳවද අවධානය යොමු කිරීම සුදුසු බවට යෝජනා කරමි. විනය බලධාරීන් විසින් 2018.08.07 දින ලබා දී ඇති විනය තීරණය වෙනස් කිරීමට හෝ ජාතික පොලිස් කොමිෂම විසින් 2019.11.05 දින ලබා දී ඇති නියෝගය වෙනස් කිරීමට අවශ්‍යය නැති බව ප්‍රකාශ කරමි. ඒ අනුව අදාළ තීරණවල වෙනසක් නොවේ. අභියාචකගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

මෙම නියෝගයේ පිටපතක් අභියාචක, පොලිස්පති හා ජාතික පොලිස් කොමිෂම වෙත නිකුත් කරන්න.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-